# කරුණාවන්ත බියුටි



ලෝචනා දම්සරණී රිදීමාලියද්ද

# කරුණාවන්ත බියුටි

## ලෝචනා දම්සරණී රිදීමාලියද්ද

කතෘ

කතෘගේ වෙනත් කෘති

යාළු රැළක්

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
6-D ශ්‍රේණිය

ISBN - 978-624-211-381-4
10.05.2026

# පිදුම

සැමදා සෙවනැල්ලක් මෙන් මා පසුපස

සිටිනා මාගේ ආදරය දෙමව්පියන්ට හා දැනුමෙන්

අධ්‍යාපනයෙන් පමණක් නොව ජීවන අවබෝධය

ලබාදී මා නිරතුරුව දැනුවත් කළ මාගේ ආදර

ගුරුතුමිය වෙත ආදරයෙන් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදූකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු   දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

එකෝමත් එක්ක නගරයක ලස්සන දු කුමාරියෝ තුන් දෙනෙක් මවත් සමග ජීවත් වුණා. දූවරුන්ගේ නම් වූයේ වැඩිමහල් දුව ජූලි දෙවැනි දුව එල්සා බාලම දුව බියුටි ය.

ඔවුන්ගේ පියා බාලම දියණිය පොඩි කාලේ මේලොව හැරදා ගිහින්. මව තමා මේ දූ කුමරියන් තිදෙනාව රැකබලා ගත්තේ.



දුකුමරියන් තුන්දෙනාගේ මව බාලම දියණියට ආදරය කළේ නැත. මව නිතරම ඇයට වෙනස්කම් කළා. ඇය සිතුවේ තම ස්වාමියා ඇයට අහිමි වූයේ බාලම දියණියගේ අවාසනාවන්තකම නිසා කියාය.

මව නිතරම අනිත් දියණියන් දෙදෙනාටත් නිතරම කියා සිටියේ බාලම කුමරිය සමඟ සෙල්ලම් කිරීමට යාමට එපා කියාය.



මව අනික් දීයණියන් දෙදෙනාට එක වගේ ආදරය කළා. ඇඳුම් පැළඳුම්, රස කැවිලි ගමන්බිමන් එක්කගෙන ගියා.

ඔවුන් බියුටි දියණියව ඔවුන්ගේ නිවසේ වැඩ කරවා ගැනීමට, ඇඳුම් සේදීමට, මිදුල අතු ගෑමට වැනි වැඩ කර ගැනීමට තියාගත්තා.



ඔවුන් කොච්චර වෙනස්කම් කළත්, බියුටි දියණිය මවටත් සහෝදරියන් දෙදෙනාටත් වෛර කළේ නෑ. ඇය ඔවුන්ට එකසේ ආදරය කළා.

බියුටි සමග සහෝදරියන් දෙදෙනා යාළුවන් නොවුනාට පුදුම යාළුවෝ ගොඩක් හිටියා. ඒ තමා මේ කුරුල්ලෝ, බකමූණෝ, ලේනෝ, පූසෝ වගේ සත්තු. ඇය ඔවුන් සමඟ දුක සැප බෙදා ගත්තා.



එක දවසක් බියුටි දියණිය එළවළු කොටුවේ එළවළු තෝරමින් සිටින විට එල්සා සහ ජූලි සෙල්ලම් කරමින් සිටිනවා දුටුවා. ටික වේලාවකින් ඔවුන් දෙදෙනා නොමැති බව දුටු බියුටි ඔවුන් කොහේදැයි විපරම් කර බැලුවා. ඇය දුටුවා ඔවුන් දෙදෙනා කළු පේළිය පැත්තට දුවනවා. එයා කෑ ගසා කීවා ඒ පැත්තට යන්න එපා භයානකයි ඔයාලා වැටෙයි. "යන්න එපා... යන්න එපා..." කියා කෑ ගසා කීවත් ඔවුන්ට ඇයව ඇසුණේ නැත.



බියුටි එළවළු කූඩය විසිකර දමා ඔවුන් පසුපස දුවගෙන ගියා. බියුටිගේ මේ කෑ ගැසීම ඇසී මවත් කලබල වී ඒ පසුපස දුවගෙන ආවා.

බියුටිට ඇහුනා "බුදු අම්මෝ අපිව බේරගන්න" කියා තම සහෝදරියන් දෙදෙනා කෑ ගසන සද්දේ. මව සහ බියුටි සද්දේ ඇසුණු දෙසට දුවගෙන ගියා. ඔවුන් දුටුවා එල්සා සහ ජූලී කන්දෙන් පල්ලෙහාට පෙරළිලා ගොසින් ගහක අත්තක එල්ලිලා සිටිනව.



බාලම දියණිය බියුටි හනි හනික බිම දිගාවී අත දිගු කර එක් එක් සහෝදරිය බැගින් ගොඩට ගත්තා. එල්සා සහ ජූලි හොඳටම තුවාල වෙලා. දෙදෙනාම බය වී හොඳටම අඬනවා. මව තම දියණියන් දෙදෙනාට හොඳටම බැන්නා බියුටි වගේ හොඳ ළමයි වගේ ඉන්න බැරි ඇයි ඔය ළමයින්ට කියලා. බියුටි නොහිටින්න මටත් ඔය දෙන්නා බේරගන්න බැරි බව මව පැවසුවා.



එල්සා සහ ජුලි බියුටිගෙන් සමාව ඉල්ලුවා එයාලා කරපු වෙනස්කම් වලට එයාලා ගොඩක් දුක් වුණා. මවත් බියුටි ගෙන් සමාව ඉල්ලුවා ඇය කරපු නපුරුකම් වලට ගොඩක් දුක් වුණා.



කාලයක් මේ හතර දෙනාම හොඳින් ජීවත් වුණා. ඔය අතරේ එකපාරටම මවට අසනීපයක් හැදුනා. වෛද්‍යවරු පවා කීවේ ඇය බේරා ගැනීමට නොහැකි බවයි.

නමුත් බියුටිගේ සිත කීවේ තම මව බේරා ගැනීමට තමන්ට හැකි බවයි. ඇය ඇයට පුළුවන් උපරිමෙන් තව මවට උපස්ථාන කරා, බෝධි පූජා පැවැත්තුවා. මව බේරාදෙන ලෙස නිතරම දෙවියන්ගෙන් කන්නලව් කළා.



වෛද්‍යවරු පවා පුදුමයට පත් කරමින් තම මව සුවපත් වුණා. වෛද්‍යවරු පවා මවට පැවසුවේ බියුටිගේ හෙදකම නිසා ඇය සුවපත් වූ බවයි. මවට තම බාලම දියණිය ගැන මහත් ආඩම්බරයක් ඇති වුණා. බියුටි තම පවුලට පමණක් නොව නගරයේ සිටින ඕනෑම කෙනෙකුට පිහිටවන්නට දෙවරක් සිතන්නේ නැහැ.

ඒ නිසා නගරවාසීන් ඇයට කරුණාවන්ත බියුටි කියා කීවා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-211-381-4